SC

# ජනමාධ්‍ය හිමිකාරීත්වය හා පක්ෂපාතීත්වය

( ශ්‍රී ලාංකීය ජනමාධ්‍ය හිමිකාරීත්වය, ඒ ඒ ජනමාධ්‍යයන්හි පක්ෂපාතීත්වය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ කරනු ලබන සන්නිවේදන විද්‍යාත්මක අධ්‍යයනය )

FACULTY OF GRADUATE STUDIES
19 OCT 2009
UNIVERSITY OF KE...

විභාග අංකය - FGS/03/02/06/2002/02

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධයකි


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 580 |
| වර්ග අංකය | |

## සාර සංග්‍රහය

ජනමාධ්‍ය හිමිකාරීත්වය, ජනමාධ්‍ය ව්‍යුහය තුළ තීරණාත්මක සාධකයකි. ලෝකයේ ජනමාධ්‍ය ආරම්භයේ සිට ම මේ පිළිබඳ විවිධ අධ්‍යයනයන්, මත දැක්වීම් සිදු කර තිබේ.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හිමිකාරීත්වය පිළිබඳ මුල්වරට සාකච්ඡා වනුයේ 1960 දශකය තුළ දී ය. ඒ පුවත්පත් ආයතනවල ක්‍රියාකාරිත්වය හා රජය අතර ඇති වූ ගැටුම් හේතුවෙනි. 1990 දශකයේ දීත් මේ පිළිබඳ ව ප්‍රබල සංවාදයක් මතු විය. ඒ පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය සඳහා බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී ය.

දේශපාලන සන්නිවේදනය මත පදනම් ව ජනමාධ්‍ය අයිතිය පිළිබඳ අධ්‍යයනයක් කළ ගාමිණී විජේතුංග ශ්‍රී ලංකාවේ පුවත්පත් අයිතිය හා දේශපාලනය අතර පවත්නා සබඳතාව පෙන්වා දුන්නේ ය. ඒ, 1947 සිට 1977 දක්වා පැවැත්වූ මැතිවරණවල දී පුවත්පත් දැක්වූ දායකත්වය පිළිබඳ විමසීමෙනි.

මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරන ලද්දේ ජනමාධ්‍ය හිමිකාරීත්වය ඒ ඒ ජනමාධ්‍යයන්හි පක්ෂපාතීත්වය සම්බන්ධයෙන් තීරණාත්මක ව සිදු කරන බලපෑම පිළිබඳ විමසා බැලීමයි. රාජ්‍ය, පවුල්, සමාගම්, තනි පුද්ගල යනාදී විවිධ ව්‍යුහයන් යටතේ හිමිකාරීත්වයක් සහිත ජනමාධ්‍ය ආයතනයන්ගේ හිමිකාරීත්වය, පාලනය හා පක්ෂපාතීත්වය පිළිබඳ පුළුල් විමසා බැලීමක් සිදු කෙරුණි.

ජනමාධ්‍ය හිමිකාරීත්වයේ පවත්නා සංකීර්ණ ස්වභාවය මේ ඔස්සේ හඳුනාගත හැකි විය. ජනමාධ්‍ය ආයතනවල කොටස්කරුවන්, අධ්‍යක්ෂවරු හා ප්‍රධාන නිලධාරීන්ගේ භූමිකාව මෙහි දී කැපී පෙනුණි.

ජනමාධ්‍ය පාලනයේ දී රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හා නීතිරීතිවල ස්වභාවය හඳුනාගත හැකිවිණි. විවිධ අවස්ථාවල දී ජනමාධ්‍යයේ අන්තර්ගතය සකස් කිරීමේ ක්‍රියාවලියට බාහිර සාධක බලපාන ආකාරය විමසා බැලිණි.

පක්ෂපාතීත්වය, ජනමාධ්‍ය හිමිකාරීත්වයේ තීරණාත්මක සාධකයකි. රාජ්‍ය, හිමිකරුවන්, කොටස් හිමියන් ආදී වශයෙන් විවිධ මැදිහත්වීම් මගින් ජනමාධ්‍යයේ පක්ෂපාතීත්වය හැඩගස්වන ආකාරය අධ්‍යයනයේ දී හඳුනාගත හැකිවිණි.

පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනී හා සිනමා මාධ්‍ය ඇසුරෙන් තත්ත්වය විමර්ශනය කරන ලදි. දේශපාලන මාධ්‍ය හිමිකාරීත්වයේ පවුල් සබඳතා ජාලයන් හා දේශපාලන ව්‍යාපාරික පවුල් සබඳතා ජාලයන් පිළිබඳ තත්ත්වයන් මෙම අධ්‍යයනය ඇසුරෙන්

වටහාගත හැකි විය. සමාලෝචනයේ දී නිදහසේ සිට වර්තමානය දක්වා ජනමාධ්‍ය - දේශපාලන පවුල් සබඳතා ජාලය ඥාතීත්වය මත පදනම් ව සකස් කෙරිණි.

රජය, මහජනතාව හා නියාමනය පිළිබඳ අංශ තුන සහිත ව 'ජනමාධ්‍ය හිමිකාරීත්ව' ආකෘතියක් ඉදිරිපත් කෙරිණි.